**නිවේදනයයි**

අධ්‍යාපන අමාත්‍යාංශය

# 2017 වර්ෂයේ රජයේ පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

2017 වර්ෂයේ දී රජයේ පාසල්වල පළමුවන ශ්‍රේණියට තම දරුවන් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන දෙමාපියන්/ නිත්‍යානුකූල භාරකරුවන් මෙම නිවේදනයේ දැක්වෙන උපදෙස් අනුව හා ලබා දී ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත් තමන්ට අදාළ වන පාසල්වල ප්‍රධානීන් වෙත **2016 ජූනි30** ට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ.

අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ යුතු ය.

**2017 වර්ෂයේ දී ................................................................. විද්‍යාලයේ**
**පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**
(ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් හා ඉදිරිපත් කර ඇති විස්තර සනාථ කිරීම සඳහා අදාළ වන ලිපි ලේඛනවල පිටපත් අයදුම්කරු විසින් ම සහතික කර මෙයට අමුණා එවිය යුතු ය.)

**01. ඉල්ලුම් කරන ගණය :-** ..............................

(ගණ කිහිපයකට අයත් නම් වෙන වෙන ම ඉල්ලුම් කළ යුතු ය.)

**02. ළමයා පිළිබඳ විස්තර :-**

2.1 සම්පූර්ණ නම :- ..............................
(වාසගමට යටින් ඉරක් අඳින්න.)
2.2 මුලකුරු සමඟ නම :- ..............................
(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා - එම්.එම්.එස්.ප්‍රනාන්දු)
2.3 ස්ත්‍රී/ පුරුෂ භාවය :- ..............................
2.4 ආගම :- ..............................
2.5 ඉගෙනුම් මාධ්‍යය (සිංහල/ දෙමළ) ..............................
2.6 උපන්දිනය :- අවුරුද්ද ....... මාසය ....... දිනය .......
2.7 2017 ජනවාරි මස 31 දිනට වයස :- අවුරුදු ..... මාස ..... දින .....

**03. අයදුම්කරු පිළිබඳ විස්තර :- (මව/ පියා/නිත්‍යානුකූල භාරකරු)**

3.1 සම්පූර්ණ නම :- ..............................
3.2 මුලකුරු සමඟ නම :- ..............................
3.3 ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................
3.4 ශ්‍රී ලාංකිකයෙක් ද :- ..............................
3.5 ආගම :- ..............................
3.6 ස්ථිර ලිපිනය :- ..............................
දුරකථන අංකය :- ..............................
3.7 පදිංචි ව සිටින දිස්ත්‍රික්කය :- ..............................
3.8 පදිංචි ස්ථානයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..............................
3.9 පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම :- .............................. අංකය :- ..............

**04. ඉල්ලුම් කරන පාසල් (මෙම පාසල ද ඇතුළු ව තම කැමැත්ත අනුපිළිවෙළට ලිවිය යුතු ය.) :-**

| අනු අංකය | පාසලේ නම | පාසල් වර්ගය (ජාතික/ පළාත්) | පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර (මීටර්/කි.මී.) |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |

| | | | |
|---|---|---|---|
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |

(ඔබගේ ළමයා ඉල්ලුම් කරන ලද පාසල් කිහිපයකට තේරුණු අවස්ථාවක දී ඔබ විසින් ඉහත සඳහන් කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙළ සළකා බලා ප්‍රමුඛතාව වැඩි පාසල ලබා දෙනු ලබන අතර අනෙකුත් පාසල් ලැයිස්තුවලින් නම ඉවත් කරනු ලැබේ.)

05. **ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල්**

1. ..........
2. ..........
3. ..........
4. ..........
5. ..........
6. ..........
7. ..........
8. ..........
9. ..........
10. ..........

**06. ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය**

(පදිංචිය සනාථ කිරීමට අවශ්‍ය ගණවලට අදාළ ව මව්පියන්/ නිත්‍යානුකූල භාරකරු විසින් ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර ලබා ගෙන මෙම කොටස සම්පූර්ණ කර තමන් විසින් ම සහතික කළ යුතු ය.)

වර්ෂය :
ඡන්ද ප්‍රදේශය :
ග්‍රාම නිලධාරී වසම හා අංකය :
ඡන්ද කොට්ඨාසය :
ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :
ඡන්ද ප්‍රදේශය :
ග්‍රාම නිලධාරී වසම හා අංකය :
ඡන්ද කොට්ඨාසය :
ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :
ඡන්ද ප්‍රදේශය :
ග්‍රාම නිලධාරී වසම හා අංකය :
ඡන්ද කොට්ඨාසය :
ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

වර්ෂය :
ඡන්ද ප්‍රදේශය :
ග්‍රාම නිලධාරී වසම හා අංකය :
ඡන්ද කොට්ඨාසය :
ගම/ වීදිය, වත්ත :

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

| |
|---|
| වර්ෂය : <br> ඡන්ද ප්‍රදේශය : <br> ග්‍රාම නිලධාරී වසම හා අංකය : <br> ඡන්ද කොට්ඨාසය : <br> ගම/ වීදිය, වත්ත : |

| ගෘහ අංකය | පිළිවෙල අංකය | ඡන්ද හිමියන්ගේ නම් (සිටින සියලු දෙනා) |
|---|---|---|
| | | |

ඉහත තොරතුරු ඡන්ද හිමි නාමලේඛන පරීක්ෂා කොට මා විසින් ම නිවැරදිව සටහන් කර ගත් බව මෙයින් සහතික කරමි.

. . . . . . . . . . . . . . .

ඉල්ලුම්කරුගේ අත්සන

07. පහත සඳහන් කොටස්වල තමා ඉල්ලුම් කරන ගණයට අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.

| කරුණු | ලකුණු (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) |
|---|---|
| **7.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්** <br><br> (අ) ඡන්දහිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනා ම/ නිත්‍යානුකූල භාරකරු ඇතුළත් ව සිටින වසර ගණන : ...................... <br> ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ නම පමණක් ඇතුළත් ව සිටින වසර ගණන : .................... <br> (අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වසර 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ.) <br> (ආ) පදිංචි ස්ථානයේ හිමිකමට අදාළ ලේඛනය : <br> ........................................................................ <br> (ඇ) පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි අතිරේක ලේඛන : <br> ........................................................................ <br> (ඇ) ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : .................. <br> (අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.) | |

**7.2 ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ දරුවන්**

(අ) ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වශයෙන් පාසලේ ඉගෙනුම ලැබූ ශ්‍රේණි සංඛ්‍යාව
.................................................................
........................ශ්‍රේණිය සිට ............................ ශ්‍රේණිය දක්වා

(ආ) පාසල් කාලය තුළ ලබා ගත් අධ්‍යාපන ජයග්‍රහණ :
..................................................................................
..................................................................................

(ඇ) පාසල් කාලය තුළ විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ :
..................................................................................

(ඈ) ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපනික ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග :
.................................................................................
.................................................................................

**7.3 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන්**

(අ) අයදුම්කරුගේ ළමයෙකු හෝ ළමයින් පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම්

| ළමයාගේ නම | ශ්‍රේණිය හා ඇතුළත්වීමේ අංකය | මෙම පාසලට ඇතුළත් වූ ශ්‍රේණිය | ගත කළ ශ්‍රේණි ගණන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

(ආ) ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනා ම/ නිත්‍යානුකූල භාරකරු ඇතුළත්ව සිටින වසර ගණන : ....................
ඡන්ද හිමි නාම ලේඛනයේ ඉල්ලුම්කරුගේ නම පමණක් ඇතුළත්ව තිබෙන වසර ගණන : ................
(අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වසර 05ක කාලයක් සඳහා මෙය අදාළ වේ.)

(ඇ) ඉල්ලුම් කරනු ලබන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවා ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ..............

(ඈ) පදිංචි ස්ථානයේ හිමිකමට අදාළ ලේඛනය :
..........................................................

(ඉ) පාසලේ සිටින සහෝදර/ සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ඉල්ලුම්කරු ලබා දුන් විවිධාකාරයේ සහයෝග :
............................

(අනිවාර්යයෙන් ම අංක 06 සම්පූර්ණ කළ යුතු ය.)

**7.4 අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්**

(අ) අදාළ ආයතනවල ස්ථිර සේවකයෙකු ලෙස තනතුර හා සේවා කාලය :
.................................................................................

(ආ) ස්ථිර පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානයට ඇති දුර (කි.මී): ....................

(ඇ) දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් අඛණ්ඩ දුෂ්කර පාසල් සේවා කාලය : ...........................................................................

(ඈ) දුෂ්කර පාසලක සේවයේ යෙදී ඇත්නම් එම සේවා කාලය : ....................

(ඉ) ලබා නොගත් නිවාඩු දින ගණන :

2015 .....................................
2014 .....................................
2013 .....................................
2012 .....................................
2011 .....................................

(ඊ) දැනට පාසලක සේවයේ යෙදී සිටී නම් එම පාසලේ නම හා එම පාසලේ සේවා කාලය :

..............................................................................................

**7.5 රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබ පැමිණි නිලධරයන්ගේ දරුවන් :**

(අ) අවසානයට ස්ථාන මාරුවීම් ලැබ නව සේවා ස්ථානයේ වැඩ භාරගත් දිනය : ............................

(ආ) ස්ථාන මාරුවීමට අදාළ ව පෙර සහ නව සේවා ස්ථානවල නම් හා ලිපිනයන් :

...................................................................................................
...................................................................................................

(ඇ) පෙර සේවා ස්ථානය හා මාරුවීම් ලැබ පැමිණි නව සේවා ස්ථානය අතර දුර (කි.මී): .............................

(ඈ)ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : ..........................

(ඉ) රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු සේවකයෙකු ලෙස සේවා කාලය : .........................

(ඊ) ලබා නොගත් නිවාඩු දින ගණන :

2015 .....................................
2014 .....................................
2013 .....................................
2012 .....................................
2011 .....................................

**7.6 අදාළ දරුවා සමඟ විදේශගතව පදිංචිව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් :**

(අ) විදේශගතව සිට නැවත දිවයිනට පැමිණි දිනය : ..........................

(ආ) ළමයා සමඟ අඛණ්ඩ ව විදේශගතව සිටි කාලසීමාව :

............................ දින සිට .............................. දින දක්වා

(ඇ) විදේශගත වූ හේතුව : ...............................................................

(ඈ)ඉල්ලුම් කරන මෙම පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න අදාළ දරුවාට ඇතුළත්වීමට හැකි වෙනත් පාසල් සංඛ්‍යාව : .....................................

08. ප්‍රකාශය :

මගේ ළමයා ඉගෙනීම පිණිස යම්කිසි රජයේ හෝ අනුමත පෞද්ගලික හෝ වෙනත් පාසලකට දැනට නොයන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. තව ද, මෙහි ඉහතින් සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය හා අනෙකුත් තොරතුරු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/ කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. මාගේ ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/කූට බව හෙළිවුවහොත් ඔහු/ ඇය පාසලෙන් ඉවත් කර ගෙන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කෙරෙන එම ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

...........................
දිනය

.........................................................
මවගේ/ පියාගේ/ නිත්‍යානුකූල භාරකරුගේ අත්සන

## <u>පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ විධිවිධාන හා උපදෙස්</u>

**1.0** අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර පහත සඳහන් කර ඇති විධිවිධාන හා තොරතුරු හොඳින් අධ්‍යයනය කළ යුතු ය.

**2.0 මූලික සුදුසුකම් :**

2.1 2017 ජනවාරි මස 31 දිනට ළමයාගේ වයස අවුරුදු 05 ක් සම්පූර්ණ විය යුතු ය. මේ සඳහා උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී නොමැති පාසල්වල පමණක් ළමයෙකුට උප්පැන්න සහතිකය නොමැති නම් ඒ වෙනුවට උපන්දිනය සනාථ කිරීමට උප්පැන්න විවාහ හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද අදාළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලබන අනුමාන වයස් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එහෙත්, පසුව උප්පැන්න සහතිකය නිශ්චිතවම ලබා දීමට කටයුතු කළ යුතු ය.

2.2 2017ජනවාරි 31 දිනට වයස අවුරුදු 06 හෝ 06 ට වැඩි ළමයින් ඇතුළත් කළ හැක්කේ වයස අවරුදු 06 ට අඩු, සුදුසුකම් සපුරා ඇති ළමයින් සියලු දෙනාම ඇතුළත් කර ගැනීමෙන් පසුව ය.

**3.0 අවධානය යොමු කළ යුතු කරුණු : (සියලු ම ගණ සඳහා)**

3.1 පළමුවන ශ්‍රේණියේ සමාන්තර පන්තියක් සඳහා 34 දෙනෙකු පාසල මඟින් ද 05 දෙනෙකු ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ ළමයින්ගෙන් ද තෝරා ගනු ලබයි. ඒ අනුව, පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 39කි.

3.2 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය සැළකිල්ලට ගෙන පුරප්පාඩු සංඛ්‍යාව ආගම් අනුව හා එක් එක් ගණ අනුව බෙදා වෙන් කරනු ලැබේ. යම් ආගමක එක් ගණයකට වෙන් කරන ලද ප්‍රමාණයට අඩු අයදුම්කරුවන් ප්‍රමාණයක් ඇති කල්හි එම පුරප්පාඩු එම ආගමට අයත් සෙසු ගණ අතර අනුපාතිකව බෙදා හැරේ. යම් ආගමකට අයත් අයදුම්කරුවන් නොමැති විට හෝ අඩුවෙන් සිටින විට හෝ එම පුරප්පාඩු අනුපාතිකව අනෙකුත් ආගම් අතර බෙදා දෙනු ලැබේ.

3.3 මව්පියන් පදිංචිව සිටින්නේ එක ම ස්ථානයක නොවන කල්හි ඔවුන් නීතියෙන් වෙන් නොවූ අය නම් ඒ අය නීතියෙන් වෙන් වීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ බව ලිපි ලේඛන මඟින් සනාථ කර ඇති විට ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයගේ (පියා හෝ මව) පදිංචි ස්ථානය, ළමයා පදිංචි ස්ථානය වශයෙන් සළකනු ලැබේ.

3.4 උසාවි තීන්දුවක් මඟින් නිත්‍යානුකූලව ස්ථිරව දරුකමට හදා ගැනීම සඳහා පත් කරනු ලැබූ පුද්ගලයෙකු මව හෝ පියා වශයෙන් පිළිගනු ලැබේ. ළමා නිවාසවල සිටින ළමයින්ගේ නිත්‍යානුකූල භාරකරු වශයෙන් නිවාසයේ භාරකරු සැලකේ. නිත්‍යානුකූලව දරුකමට හදා ගන්නා පුද්ගලයා විසින් ඒ පිළිබඳ උසාවි තීන්දුව අයදුම්පත භාර ගන්නා අවසාන දිනට පෙර ලබා තිබිය යුතු ය. මව හා පියා දෙදෙනා ම මිය ගොස් ඇති අවස්ථාවක පමණක් ළමයාට රැකවරණය සලසන පුද්ගලයාට එම ළමයාගේ භාරකරු ලෙස ළමයා වෙනුවෙන් ඉල්ලුම් කළ හැකි ය.

3.5 දරුවාගේ මව හා පියා විදේශ ගත ව සිටි අවස්ථාවක දී හෝ දෙමාපියන්ගෙන් එක් අයෙකු ජීවතුන් අතර නොමැති විට සහ අනෙක් පුද්ගලයා විදේශ ගත ව ඇති විටක නිත්‍යානුකූලව භාරකාරත්වය පවරා නොතිබුණ ද තාවකාලිකව ළමයාගේ භාරකාරත්වය උසුලන්නාට ළමයාගේ දෙමව්පියන්ගේ නමින් ඉල්ලුම් කළ හැකි ය. එසේ වුව ද ඉහත කරුණුවලට අදාළ වූ ලිපි ලේඛන සලකා බලනු ලබන්නේ දරුවාගේ දෙමාපියන්ට අදාළව ය. එසේ ම ළමයාගේ මව/පියා විදේශගත වී සිටීම හෝ ජීවතුන් අතර, නොමැති වීම පිළිබඳව අදාළ සහතික මඟින් සනාථ කළ යුතු ය.

3.6 මව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් පාසල අයත් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටිය යුතු ය. යම් පාසලක් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශ මායිමක පිහිටා ඇති අවස්ථාවක මායිමේ ඇති අනෙක් පරිපාලන දිස්ත්‍රික්කයේ ආසන්නම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචිකරුවන්ට ද එම පාසලට අයදුම් කළ හැකි ය. මෙය අදාළ පාසලේ පෝෂිත ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලැබේ. ආදි ශිෂ්‍යා ගණය සඳහා මෙම සීමාව බල නොපැවැත්වේ.

## 4.0 අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙල:

4.1 ක්‍රියාන්විත රාජකාරී සඳහා ලබා දෙන විශේෂ අනුග්‍රහය යටතේ තම දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ නිලධාරීන් තම අයදුම්පත් අදාළ සේවාවේ සුබසාධක අධ්‍යක්ෂ වෙතින් ලබා ගෙන, විධිමත්ව සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් අදාළ සුබසාධක අධ්‍යක්ෂ වෙත නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

4.2 තම දරුවා සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන අනෙකුත් සියලු ම මව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් අදාළ පාසලේ විදුහල්පති වෙත 2016 ජූනි 30 ට ප්‍රථම ලැබෙන සේ අයදුම්පත සමඟ තම නම, ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද ළමයා ඇතුළත් කිරීම සඳහා **අවශ්‍ය සුදුසුකම් පිළිබඳ තමන් විසින් ම සහතික කළ ලිපි ලේඛනවල පිටපත් ද** සහිතව ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවෙන් අයදුම්පත් ලැබෙන පාසල්වල පමණක් මෙම අයදුම්පත් අතින් වුව ද ගෙනවිත් භාර දිය හැකි අතර, අතින් ගෙනවිත් භාර දෙන්නේ නම් විදුහලින් එම ඉල්ලුම්පත භාර ගත් බවට ලදුපතක් ලබා ගත යුතු ය.

4.3 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ දරුවන් ඍජුව ම පාසලට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් අදාළ පාසලේ විදුහල්පති වෙත ද සාමාන්‍ය පටිපාටිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

4.4 මව්පියන්/නිත්‍යානුකූල භාරකරුවන් එක් පාසලකට ගණ කිහිපයක් යටතේ ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ නම් එම එක් එක් ගණයට වෙන වෙන ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව අදාළ ගණය ලියා එවිය යුතු ය.

4.5 සෑම අයදුම්කරුවෙකු ම **අවම වශයෙන් තමාට ආසන්න පළාත් සභා පාසල් 03ක් ද ඇතුළු ව පාසල්, 06 කට ඉල්ලුම් කළ යුතු ය. පාසල් නම් කිරීමේ දී සෑම ඉල්ලුම්පත්‍රයක ම එම පාසල් ප්‍රමුඛතා අනුපිළිවෙලින් සඳහන් කළ යුතු ය.** එසේ ම පාසල් 06කට ඉල්ලුම් කර එම පාසල්වලින් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඒ සඳහා සහභාගී නොවන අයදුම්කරුවන් හා අයදුම් නොකළ දෙමාපියන්, නිත්‍යානුකූල භාරකරුවන් පාසලක් නොලැබීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ය. එම අභියාචනා සැලකිල්ලට ගෙන ඔහු විසින් නම් කරනු ලබන පාසලකට තම ළමයා ඇතුළත් කළ යුතු ය.

4.6 සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙන් ම ඉගැන්වීම් කටයුතු කරන පාසල් සඳහා අයදුම් කරන්නේ නම්, මාධ්‍ය දෙක සඳහා ම වෙන වෙන ම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. එහෙත්, එක් මාධ්‍යයකින් පාසලට තේරුණු පසු ව එම මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 5.0 තෝරා ගැනීමේ කාර්ය පටිපාටිය

5.1 නියමිත දිනට ලැබූ අයදුම්පත් සංඛ්‍යාව පාසලේ පළමුවන ශ්‍රේණියට පාසල මඟින් තෝරා ඇතුළත් කර ගත හැකි ළමයින් සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ළමයින් තෝරා ගැනීම කරනු ඇත.

5.2 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පළමුව අයදුම්පත් පරීක්ෂා කර, පහත සඳහන් කර ඇති ලකුණු ක්‍රමයට අනුව ලකුණු ලබා දෙනු ඇත. ඉන් අනතුරුව එම ලකුණු ප්‍රමුඛතා අනුව පාසලට සම්මුඛ පරීක්ෂණය මඟින් ඇතුළත් කර ගත හැකි සිසුන් සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් තෝරා ගෙන එම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ඇත.

5.3 පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් තුළ අයදුම්කරුවන් ඇතුළත් නොවන්නේ නම් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොකෙරේ. එහෙත් මේ සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවීමේ හේතු පැහැදිලිව ම සඳහන් කර ලිඛිතව ම සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට පෙර අයදුම්කරුවන්ට දැන්වීමට විදුහල්පති විසින් කටයුතු කරනු ඇත.

5.4 සුදුසුකම් තිබියදීත් තම දරුවාගේ ඉල්ලුම්පත්‍රය සිව් ගුණයට නොගෙන ප්‍රතික්ෂේප වී ඇත් නම් පමණක්, අදාළ ලිපි ලේඛන සහිත ව (පෙර අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලැබූ ලේඛන) නැවත ඉල්ලුම්පත්‍රයක් හා ලකුණු සනාථ කිරීම සඳහා තර්කානුකූල ව ඉදිරිපත් කරන තොරතුරු ඇතුළත් ඉල්ලීමක් ප්‍රතික්ෂේපිත ලිපියේ පිටපතක් සමඟ එම පාසලේ විදුහල්පති වෙත ඉදිරිපත් කළ හැකි ය. ලියුම් කවරයේ වම් කෙළවරේ "පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - නැවත සලකා බැලීම" ලෙස සඳහන් කර ප්‍රතික්ෂේප ලිපිය ලැබී සතියක් ඇතුළත එවිය යුතු ය.

## 6.0 තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා ක්‍රමවේදය

(අ) යම් පාසලක පළමුවන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩුවලින් පාසල මඟින් තෝරා ගන්නා ළමයින් සංඛ්‍යාව මෙහි දැක්වෙන ප්‍රතිශත අනුව පහත සඳහන් ගණවලට අයත් ළමයින් අතරින් තෝරා ගැනේ.

| | | |
|---|---|---|
| I. | පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් | 50% |
| II. | අදාළ පාසලේ ආදි සිසු/ සිසුවියන් වන මව්පියන්ගේ දරුවන් | 25% |
| III. | දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන් | 15% |
| IV. | අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන් | 05 % |
| V. | රජයේ සේවා අවශ්‍යතා මත මාරුවීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් | 04% |
| VI. | ළමයා සමඟ විදේශගතව පදිංචි ව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් | 01% |

(ආ) එක් එක් ගණ යටතේ සඳහන් කර ඇති ලකුණු ක්‍රමයට අනුව තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දෙනු ඇත. මෙහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 ක් වේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවලින් අවම වශයෙන් එක් ලේඛනයක් හෝ නීත්‍යානුකූල නොවන ලේඛනයක් වන්නේ නම් එම හේතුව නිසා ම එකී අයදුම්පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීමට ලක්විය හැක.

(ඈ) ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි වූ විස්තර සටහන් කර ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයේ ඉඩකඩ ලබා දී ඇත. තම පදිංචිය සනාථ කිරීම පිණිස ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි වූ විස්තර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන දෙමාපියන්/ නීත්‍යානුකූල භාරකරුවන් ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර ලබා ගෙන මෙම කොටස සම්පූර්ණ කර තමන් විසින් ම සහතික කළ යුතු ය.

(ඉ) පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සළකා බැලීමේ දී පාසලේ සිට පදිංචි නිවස සඳහා වූ අහස් දුර ගණනය කරන අතර රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති සිතියම භාවිතා කරනු ඇත. අයදුම්කරුගේ නිවස (ප්‍රධාන දොරටුව) කේන්ද්‍රය කර ගෙන ඉල්ලුම් කරන පාසලේ ප්‍රධාන කාර්යාලයට (ප්‍රාථමික අංශය වෙන ම ස්ථානයක පවතින්නේ නම් එම කාර්යාලයට) ඇති දුර අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළට ඇතුළත් පාසල් සඳහා ලකුණු අඩු කරනු ලැබේ. යම් පාසලක් ඉහළ වෘත්ත සීමාව තුළ පිහිටිය ද පවතින ස්වාභාවික බාධාවන් නිසා (උදා: ගංගා, කලපු, වගුරු බිම්, රක්ෂිත වනාන්තර ආදිය) එම පාසලට ගමන් කිරීමට නොහැකි නම් අදාළ පාසලට ලකුණු අඩු නොකළ යුතු ය.

(ඊ) පදිංචිය සනාථ කිරීමට අදාළ ලිපි ලේඛන, ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ පදිංචිව සිටින ස්ථානයට අදාළව ම තිබිය යුතු ය.

**6.1 පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් - 50%**

(අ) මෙම ගණය යටතේ පෝෂිත ප්‍රදේශය (පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ විධි විධාන හා උපදෙස්හි 3.6 උප වගන්තියට අනුව) තුළ පදිංචි සියලුදෙනාට ම අයදුම් කළ හැකි ය. මෙහි දී පදිංචිය ඉතා වැදගත් වේ.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමයට අනුකූලවය.

**ලකුණු ක්‍රමය**

I. පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

(අ) ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචියට ලකුණු ලබා දීමේ දී අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක් (2015-2011) සළකා බලනු ලැබේ.

| **විස්තරය (මව/පියා/නිත්‍යානුකූල භාරකරුගේ ඡන්ද ලියාපදිංචිය)** | **ලකුණු** |
|---|---|
| • මව හා පියාගේ නම්/නිත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් | 35 |
| • මව/ පියාගේ නම වර්ෂ 05ක් ද අනෙක් අයගේ නම ඕනෑම වර්ෂ 03ක්වත් ලියාපදිංචි වි තිබේ නම් | 35 |
| • මව/පියාගේ නම වර්ෂ 05ක් ද අනෙක් අයගේ නම ඕනෑ ම වර්ෂ 02ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 29 |
| • මව/පියාගේ නම වර්ෂ 05ක් ද අනෙක් අයගේ නම ඕනෑ ම වර්ෂයක් ද ලියාපදිංචි වී තිබේ නම් | 27 |
| • මව/පියාගේ නම පමණක් වර්ෂ 05ක් තිබේ නම් | 25 |

ඉහත ලකුණු ක්‍රමයෙන් ආවරණය නොවන අවස්ථාවන්හි දී එක ම වර්ෂයක දී දෙමාපියන් දෙදෙනාගේ ම නම් ඡන්ද හිමි නාම ලේඛනයෙහි ලියාපදිංචි ව තිබේ නම් වර්ෂයකට ලකුණු 07 බැගින් ද, එක් අයෙකු පමණක් ලියාපදිංචි වී තිබේ නම් ලකුණු 05 බැගින් ද, ලබා දෙනු ලැබේ.

(ආ) එසේ ම, පෙර වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී සිටි ඉල්ලුම්කරුගේ කලත්‍රයා විදේශගතව සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නිත්‍යානුකූලව දික්කසාද වී ඇත්නම් අදාළ ලිපි ලේඛන සැලකිල්ලට ගෙන දෙදෙනා සිටින සේ සලකා ලකුණු ලබා දෙනු ඇත.

(ඇ) පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මඟිනි. එහෙත්, දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි අයදුම්කරුවෙකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි

නාමලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට ඉල්ලුම්කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි පාසල් සඳහා අඩු කරනු ලබන ලකුණු, නොවෙනස් වන්නේ නම් පමණක් ස්ථාන දෙකින් ම ඉදිරිපත් කර ඇති ඡන්දහිමි නාමලේඛන දැනට පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාම ලේඛනය සේ සලකා ලකුණු ලබා දෙනු ඇත. (උපරිම ලකුණු 35)

II. පදිංචිය තහවුරු කරන ලේඛන

අදාළ පුද්ගලයාගේ නමට ඇති පදිංචිය තහවුරු කරන ලේඛනය තමා නමින් පැවරී වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් හෝ ගත වී ඇත්නම් සම්පූර්ණ ලකුණු ද වසර 05 ට අඩු හා වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් හෝ ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 75% ක් ද, වසර 03 ට අඩු හා වසරකට වැඩි නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 50% ක් ද වසරකට වඩා අඩු නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 25% ක ලකුණු ප්‍රමාණයක් ද ලබා ගැනීමට හිමිකම ඇත. (පදිංචි ස්ථානයේ හිමිකමට හා අතිරේක ලේඛන සඳහා මෙය අදාළ කර ගනු ලැබේ.)

(අ) පදිංචි ස්ථානයේ හිමිකම

- ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් - ලකුණු 10

- ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ හෝ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් - ලකුණු 06

  හිමිකම අනෙකුත් අයගේ නමට තිබේ නම් මෙම ලකුණු ලබා නොදේ.

  ඉහත පදිංචියට අදාළ හිමිකම තහවුරු කරන ලේඛන ලෙස පහත ලේඛන පිළිගැනේ.
  - ✓ සින්නක්කර ඔප්පු
  - ✓ තෑගි ඔප්පු
  - ✓ දීමනා පත්‍ර
  - ✓ රජයේ ප්‍රදාන
  - ✓ විහාර හා දේවාල ගම් පනත යටතේ නිකුත් කර ඇති ලේඛන
  - ✓ පත් ඉරු මඟින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු
  - ✓ ගෙවීමේ පදනම මත මිළ දී ගෙන ඇති නිවාස ලේඛන

  අවශ්‍ය වන්නේ නම් පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර හිමිකම තහවුරු කර ගැනේ.

- ලියාපදිංචි බදු ඔප්පුව/ රජයේ නිල නිවාස ලේඛනය(තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය) /ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වී කුලී නිවැසියන් ලෙස සනාථ කරන ලේඛන - ලකුණු 04

- ලියාපදිංචි නොකළ බදු ඔප්පුව - ලකුණු 02

(උපරිම ලකුණු 10)

(ආ) පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන

එක් ලේඛනයක් සඳහා එක් ලකුණක් බැගින් ලකුණු 05 (ජාතික හැඳුනුම්පත/ විදුලි බිල්පත්/ ජල බිල්පත්/ ස්ථාවර හෝ ජංගම දුරකථන බිල්පත්/ රියදුරු බලපත්‍රය/සෞඛ්‍ය ප්‍රවර්ධන කාඩ්පත/සමෘද්ධි හිමිකම් කාඩ්පත/පාසල හැරයාමේ සහතිකය/ විවාහ සහතිකය /රක්ෂණ හිමිකම් ඔප්පුව/බැංකු ගිණුම්/පත්වීම් ලිපි යනාදිය) (උපරිම ලකුණු 05)

III. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

ඉල්ලුම්කරුගේ පදිංචිය සනාථ වන්නේ නම් පමණක් ඔහු/ඇය විසින් තමන් දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ, අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් එවැනි අවස්ථාවක දී උපරිම ලකුණු ලබා දෙනු ඇත. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කරනු ඇත.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.) (උපරිම ලකුණු 50)

මෙම ගණය යටතේ අයදුම්කරුගේ පදිංචිය සනාථ නොවන්නේ නම් ලබා දුන් ලකුණු අවලංගු කරනු ඇත.

**6.2 අදාළ පාසලේ ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වන මව්පියන්ගේ දරුවන් - 25%**

(අ) මේ ගණය යටතේ අදාළ පාසලේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක වශයෙන් ළමයාගේ මව/ පියා/නීත්‍යානුකූල භාරකරුට අයදුම් කළ හැකි ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුව ය.

**ලකුණු ක්‍රමය**

I. අයදුම්කරු පාසලේ අධ්‍යාපනය ලැබූ එක් ශ්‍රේණියකට ලකුණු 02 බැගින්. (ශ්‍රේණියක නැවත රැඳීම වෙනුවෙන් ලකුණු ලබා නොදේ.) (උපරිම ලකුණු 26)

II. පාසල් කාලය තුළ අයදුම්කරු විසින් ලබා ගත් අධ්‍යාපනික ජයග්‍රහණ (උපරිම ලකුණු 25)

III. පාසල් කාලය තුළ අයදුම්කරු විසින් විෂය සමගාමී කටයුතුවලින් ලබා ගත් ජයග්‍රහණ (උපරිම ලකුණු 25)

IV. ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වය, පාසල් කාලයෙන් පසු ලබා ඇති අධ්‍යාපනික ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග (මෙහි දී පාසලේ දියුණුව සඳහා ලබා දුන් විවිධ ආකාරයේ සහයෝග සඳහා ලබා ගත හැක්කේ උපරිම ලකුණු 06 ක් පමණි.) (උපරිම ලකුණු 24)

සටහන - II, III හා IV හි සඳහන් උපරිම ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලබා දී ඇති චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි නොවන ආකාරයට බෙදා වෙන් කර ගත හැකි ය.

## 6.3 දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් - 15%

(අ) ළමයාගේ මව්පියන්ගේ/ නිත්‍යානුකූල භාරකරුගේ වැඩිමහල් ළමයින් දැනටමත් එම පාසලේ ඉගෙනුම ලබමින් සිටී නම් මෙම ගණය යටතේ අයදුම් කළ හැකි ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුව ය.

**ලකුණු ක්‍රමය**

I. පාසලේ සිටින සහෝදර/ සහෝදරියන්

(අ) පාසලේ ඉගෙනුම ලබන සහෝදර/ සහෝදරියන් සංඛ්‍යාව කොපමණ වුව ද ලකුණු ලබා ගත හැක්කේ ඉන් එක් අයෙකු සඳහා පමණි. එසේ ලකුණු ලබා දීමේ දී ඔහු/ ඇය එම පාසලේ ගත කළ එක් ශ්‍රේණියක් වෙනුවෙන් ලකුණු 02 බැගින් (ලකුණු 20)

(ආ) අදාළ පාසලේ ඉගෙනුම ලබන ඉහත සඳහන් කළ සහෝදරයා/සහෝදරිය පළමු ශ්‍රේණියට ඇතුළත්ව ඉගෙනුම ලබන්නේ නම් (ලකුණු 05)

(ඇ) අදාළ පාසලේ සහෝදරයන්/සහෝදරියන් දෙදෙනෙකු හෝ දෙදෙනෙකුට වඩා ඉගෙනුම ලබන්නේ නම් (ලකුණු 05)

(උපරිම ලකුණු 30)

II. පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය.

ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී ඇති බව සටහන් කිරීමට අයදුම්පතෙහි ලබා දී ඇති කොටස (අංක 06) සම්පූර්ණ කර ලියාපදිංචිය සනාථ කළ යුතු ය.

(අ) ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචියට ලකුණු ලබා දීමේ දී අයදුම් කරන වර්ෂයට පෙර වර්ෂයේ සිට ආසන්න වර්ෂ 05ක් (2015-2011) සළකා බලනු ලැබේ.

| **විස්තරය (මව/පියා/නිත්‍යානුකූල භාරකරුගේ ඡන්ද ලියාපදිංචිය)** | **ලකුණු** |
|---|---|
| • මව හා පියාගේ නම්/ නීත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් | 15 |
| • මව/පියාගේ නම වර්ෂ 05ක් ද අනෙක් අයගේ නම ඕනෑම වර්ෂ 03ක්වත් ලියාපදිංචි වී තිබේ නම් | 15 |
| • මව/ පියාගේ නම වර්ෂ 05ක් ද අනෙක් අයගේ නම ඕනෑ ම වර්ෂ 02ක් ද ලියාපදිංචි වී තිබේ නම් | 12 |
| • මව/ පියාගේ නම වර්ෂ 05ක් ද අනෙක් අයගේ නම නම ඕනෑ ම වර්ෂයක් ද ලියාපදිංචි වී තිබේ නම් | 11 |
| • මව/ පියාගේ නම පමණක් වර්ෂ 05ක් තිබේ නම් | 10 |

(උපරිම ලකුණු 15)

ඉහත ලකුණු ක්‍රමයෙන් ආවරණය නොවන අවස්ථාවන්හි දී එක ම වර්ෂයක දී දෙමව්පියන් දෙදෙනාගේ ම නම් ඡන්දහිමි නාමලේඛනහි ලියාපදිංචි ව තිබේ නම්, ලකුණු 03 බැගින් ද

එක් අයෙකු පමණක් ලියාපදිංචි වී තිබේ නම් ලකුණු 02 බැගින් ද ලබා දෙනු ඇත.

(ආ) පෙර වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී සිටි ඉල්ලුම්කරුගේ කලත්‍රයා විදේශගතව සිටී නම් හෝ මිය ගොස් ඇත්නම් හෝ නිත්‍යානුකූලව දික්කසාද වී ඇත්නම් හෝ අදාළ ලේඛන සැලකිල්ලට ගෙන දෙදෙනා ම සිටින සේ සලකා බලා ලකුණු ලබා දෙනු ඇත.

(ඇ) පදිංචිය සඳහා ලකුණු ලබා දෙන්නේ දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපි ලේඛන මඟිනි. එහෙත්, දැනට පදිංචි වී සිටින ස්ථානයේ පදිංචි වීමට පෙර පෝෂිත ප්‍රදේශය තුළ තවත් ස්ථානයක පදිංචි වී සිටි අයදුම්කරුවෙකු තම අවම වසර 05ක පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛන ස්ථාන දෙකෙන් ම ඉදිරිපත් කරන විට ඉල්ලුම්කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි පාසල් සඳහා අඩු කරනු ලබන ලකුණු, නොවෙනස් වන්නේ නම් පමණක් ස්ථාන දෙකින් ම ඉදිරිපත් කර ඇති ඡන්දහිමි නාමලේඛන දැනට පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාම ලේඛනය සේ සලකා ලකුණු ලබා දිය යුතු ය.

III. පදිංචිය තහවුරු කරන ලේඛන (පදිංචි ස්ථානයේ හිමිකම)

අදාළ පුද්ගලයාගේ නමට පදිංචිය තහවුරු කරන ලේඛන ඉදිරිපත් කරන විට ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇත්නම් සම්පූර්ණ ලකුණු ද වසර 05 ට අඩු හා වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් ගත වී ඇත්නම් මුළු ලකුණු ප්‍රමාණයෙන් 75% ක් ද වසර 03 ට අඩු හා වසරකට වැඩි මුළු ලකුණු ප්‍රමාණයෙන් 50% ක් ද වසරකට වඩා අඩු නම් 25%ක ලකුණු ප්‍රමාණයක් ද ලබා දිය යුතු ය.

- ඉල්ලුම්කරුගේ/කලත්‍රයාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් - ලකුණු 10
- ඉල්ලුම්කරුගේ/ කලත්‍රයාගේ මවගේ හෝ පියාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම් ඔප්පුව තිබේ නම් - ලකුණු 06

හිමිකම අනෙකුත් අයගේ නමට තිබේ නම් මෙම ලකුණු ලබා නොදේ.

ඉහත පදිංචියට අදාළ හිමිකම තහවුරු කරන ලේඛන ලෙස, පහත ලේඛන පිළිගැනේ.

- ✓ සින්නක්කර ඔප්පු
- ✓ තෑගි ඔප්පු
- ✓ දීමනා පත්‍ර
- ✓ රජයේ ප්‍රදාන
- ✓ විහාර හා දේවාල ගම් පනත යටතේ නිකුත් කර ඇති ලේඛන
- ✓ පත් ඉරු මඟින් සනාථ කර ඇති වසර 10කට වැඩි කාලයක් සහිත ප්‍රකාශන ඔප්පු
- ✓ ගෙවීමේ පදනම මත මිළ දී ගෙන ඇති නිවාස ලේඛන

අවශ්‍ය වන්නේ නම් පත්ඉරු හා දෙවන පිටපත් පරීක්ෂා කර හිමිකම තහවුරු කර ගත යුතු ය.

- ලියාපදිංචි බදු ඔප්පුව/ රජයේ නිල නිවාස ලේඛනය(තනිකඩ නිල නිවාසවල පදිංචිකරුවන් අදාළ කර නොගත යුතු ය)/

ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වී කුලී නිවැසියන් ලෙස සනාථ කරන ලේඛන - ලකුණු 04

- ලියාපදිංචි නොකළ බදු ඔප්පුව - ලකුණු 02

(උපරිම ලකුණු10)

IV පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

අයදුම්කරු පදිංචි ස්ථානයේ සිට තමන් විසින් ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දෙනු ඇත. යම් හෙයකින් ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න එක් පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කරනු ලැබේ.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.) (උපරිම ලකුණු35)

V. පාසලේ සිටින සහෝදර/සහෝදරියන් පාසලට ලබා දී ඇති ජයග්‍රහණ හා පාසලේ දියුණුව සඳහා දෙමව්පියන් විසින් පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග
(පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග සඳහා ලබා ගත හැක්කේ ලකුණු 04 ක් පමණි.)

(උපරිම ලකුණු 10)

**6.4 අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන් - 05%**

(අ) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක මව/ පියා/ නීත්‍යානුකූල භාරකරු ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට සේවයේ නියුක්තව සිටී නම් පමණක් මෙම ගණයට ඉල්ලුම් කළ හැකි ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමයට අනුව ය.

**ලකුණු ක්‍රමය**

I. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු ලෙස සේවා කාලය පූර්ණ වර්ෂයකට ලකුණු 02බැගින් (උපරිම ලකුණු 20)

II වර්තමාන ස්ථිර පදිංචි ස්ථානයේ සිට වර්තමාන සේවා ස්ථානයට ඇති දුර

| | |
|---|---|
| කි.මී. 100 ට වැඩි නම් | - ලකුණු 35 |
| කි.මී.99 සිට කි.මී. 50 දක්වා | - ලකුණු 25 |
| කි.මී.49 සිට කි.මී. 25 දක්වා | - ලකුණු 15 |
| කි.මී. 25 ට අඩු නම් | - ලකුණු 05 |

(උපරිම ලකුණු 35)

මෙම ලකුණු ලබා ගත හැක්කේ ස්ථිර පදිංචි ස්ථානයට අදාළ පෝෂිත ප්‍රදේශය තුළ ඇති පාසලකට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන්ට පමණි. (පදිංචිය තහවුරු කළ යුතු ය.)

III දුෂ්කර පාසල් සේවා කාලය (දුෂ්කර පාසල් සේවා කාලය අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කළ යුතු ය.)

(අ) දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් දුෂ්කර සේවා කාලය (මෙම කාලය අඛණ්ඩව තිබිය යුතු යි.) - පූර්ණ වසරකට ලකුණු 05 බැගින් ලකුණු 25

(ආ) දැනට දුෂ්කර පාසලක සේවයේ නොයෙදෙන නමුත් මීට පෙර දුෂ්කර සේවයේ යෙදුණේ නම් සේවා කාලය - පූර්ණ වසරකට ලකුණු 03 බැගින් ලකුණු 15

(උපරිම ලකුණු 25)

**සැ.යු -** අවම වශයෙන් වසරකට වඩා වැඩි දුෂ්කර සේවා කාලයක් සපුරා ඇති අයට පමණක් පූර්ණ වසරකට වඩා වැඩි වන මාස හයක් හෝ ඊට වැඩි වන මාස ගණනට අදාළ ලකුණෙන් භාගයක් සඳහා හිමිකම ඇත.

IV ලබා නොගත් නිවාඩු

ඉල්ලුම්පත් භාර ගන්නා වර්ෂයට පෙර වසර 05 ක් සඳහා ලිත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින 20 ට ලකුණු 02 බැගින් (වර්ෂයකට ලබා නොගත් නිවාඩු දින 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදෙනු ඇත.) (උපරිම ලකුණු 10)

V දරුවා ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන පාසලේ ම සේවයේ යෙදෙන්නේ නම්

- සේවා කාලය අවු.03 හෝ ඊට වැඩි නම් ලකුණු 10
- සේවා කාලය අවු.03 ට අඩු නම් ලකුණු 05

(උපරිම ලකුණු 10)

## 6.5 රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන් - 04%

(අ) මෙම ගණය යටතේ රජයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු නිලධරයකුගේ ඉල්ලීම මත නොව රජයේ/ ආයතනයේ සේවා අවශ්‍යතා මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වසර 05 ක කාලයක් ඇතුළත පාසල පිහිටි ප්‍රදේශය තුළ ස්ථාපිත ආයතනයකට ස්ථාන මාරුවීම් ලැබ පැමිණ පාසලේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචිව සිටින්නේ නම් පමණක් ඉල්ලුම් කළ හැකිය.

මෙහි දී පාසල පිහිටි ප්‍රදේශය යනුවෙන් අදහස් වන්නේ අදාළ පාසල කේන්ද්‍රය කර කිලෝ මීටර් 2ක් අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළ අදාළ ආයතනය පිහිටා තිබීම වේ. (අවශ්‍ය වන්නේ නම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට මෙම සීමාව වැඩි කර ගත හැක). එමෙන් ම පෙර සේවා ස්ථානය පිහිටා ඇති ප්‍රදේශයේ දරුවා ද සමඟ පදිංචි ව සිට, නව සේවා ස්ථානයට අදාළ පදිංචි ස්ථානයට දරුවා සමඟ පැමිණිය යුතු ය. තව ද, අවසානයට ලද ස්ථාන මාරුව පමණක් සලකා බලනු ඇත. එමෙන් ම, අනුයුක්ත කිරීම්, පුහුණු පාඨමාලා හා අධ්‍යයන කටයුතු සඳහා පදිංචිය වෙනස් කිරීම් ආදිය මේ යටතේ සලකනු නොලැබේ.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුවය.

**ලකුණු ක්‍රමය**

I. පෙර සේවා ස්ථානයේ සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇති නව සේවා ස්ථානය අතර දුර

| | |
|---|---|
| කි.මී. 150 ට වැඩි නම් | - ලකුණු 40 |
| කි.මී.149 සිට කි.මී. 100 දක්වා | - ලකුණු 32 |
| කි.මී.99 සිට කි.මී. 50 දක්වා | - ලකුණු 24 |
| කි.මී.49 සිට කි.මී.25 දක්වා | - ලකුණු 16 |
| කි.මී. 25 ට අඩු නම් | - ලකුණු 08 |

(උපරිම ලකුණු 40)

II. ස්ථාන මාරුවීම් ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව (පදිංචිය සනාථ කළ යුතු ය.)

දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දෙනු ඇත. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ තම දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කරනු ඇත.

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.) (උපරිම ලකුණු 35)

III. රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය බැංකු සේවකයකු ලෙස සේවා කාලය - වසරකට එක් ලකුණක් බැගින් (උපරිම ලකුණු 10)

IV. ස්ථාන මාරුවීම් ලැබ ගත වූ කාලය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට)

| | |
|---|---|
| වර්ෂයක කාලයක් තුළ නම් | - ලකුණු 05 |
| වර්ෂ 01 – 02 කාලයක් තුළ නම් | - ලකුණු 04 |
| වර්ෂ 02 – 03 කාලයක් තුළ නම් | - ලකුණු 03 |
| වර්ෂ 03 – 04කාලයක් තුළ නම් | - ලකුණු 02 |
| වර්ෂ 04 – 05 කාලයක් තුළ නම් | - ලකුණු 01 |

(උපරිම ලකුණු 05)

V. ලබා නොගත් නිවාඩු

ඉල්ලුම්පත් භාර ගන්නා වර්ෂයට පෙර වසර 05 ක් සඳහා ලිත් වර්ෂය තුළ ලබා නොගත් නිවාඩු දින20 ට ලකුණු 02 බැගින් (වර්ෂයකට ලබා නොගත් නිවාඩු දින 20 ට වඩා අඩු නම් ලකුණු ලබා නොදේ.) (උපරිම ලකුණු 10)

**සැ.යු -** පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පසු හෝ පළමු ශ්‍රේණිය ආරම්භ වීමෙන් පසු හෝ රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලැබ/ අදාළ දරුවා සමඟ විදේශගතව සිට පැමිණෙන නිලධරයන්ගේ දරුවන්ට පාසල් ලබාදීම සඳහා අදාළ පාසල අයත්වන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට ඉල්ලුම්පත් යොමු කළ යුතුය. අදාළ අධ්‍යාපන බලධාරීන් විසින් තීරණය කරන ලද පාසල් මෙම දෙමාපියන්ගේ දරුවන් සඳහා ලබා දෙනු ඇත.

## 6.6 ළමයා සමඟ විදේශගත ව පදිංචිව සිට පැමිණෙන තැනැත්තන්ගේ දරුවන් - 01%

(අ) මෙම ගණය යටතේ ළමයා සමඟ විදේශගත ව පදිංචි ව සිට ඉල්ලුම්පත් භාරගන්නා වර්ෂයට පෙර වර්ෂයේ ජූලි මස 01 වන දින සිට ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දින දක්වා කාලය තුළ මෙරටට පැමිණෙන මව/ පියා/නීත්‍යානුකූල භාරකරුට ඉල්ලුම් කළ හැකිය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් සිදු කරනුයේ පහත දක්වා ඇති ලකුණු ක්‍රමය අනුවය.

**ලකුණු ක්‍රමය**

I. දිවයිනට පැමිණි දිනය දක්වා ළමයා සමඟ විදේශගත වී සිටි කාලය

| | | |
|---|---|---|
| අඛණ්ඩව වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් | ලකුණු 25 | |
| අඛණ්ඩව වසර 02 සිට වසර 03 ක් දක්වා | ලකුණු 15 | |
| අඛණ්ඩව වසර 01 සිට වසර 02 දක්වා | ලකුණු 10 | (උපරිම ලකුණු 25 |

(මෙම කාලය තුළ මසකට අඩු කාලයක් නිවාඩු ලබා ලංකාවට පැමිණ නැවතත් අදාළ ස්ථානයට ගොස් ඇත්නම් අඛණ්ඩ කාලය ඛණ්ඩනය නොවන බව සැලකිය යුතු ය. )

II. විදේශගත වූ ස්වභාවය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා දූත මණ්ඩල රාජකාරි සඳහා | ලකුණු 40 | |
| ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා (රජය මඟින් හෝ රජය වෙනුවෙන් විදේශයක රාජකාරියක් ඉටු කිරීම සඳහා පත් කළ පුද්ගලයන් සඳහා) | ලකුණු 30 | |
| ශිෂ්‍යත්වයක් සඳහා | ලකුණු 20 | |
| පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා | ලකුණු 10 | (උපරිම ලකුණු 40 |

III. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

පදිංචි ස්ථානයේ (පදිංචිය සනාථ කළ යුතුය.) සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දෙනු ඇත. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්නයේ අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශය සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න පාසලක් වෙනුවෙන් ලකුණු 05 බැගින් අඩු කරනු ඇත. (උපරිම ලකුණු 35

(අදාළ දරුවාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම දරුවාට ඇතුළත් වීමට අවශ්‍ය ඉගෙනුම් මාධ්‍යය සහිත පාසලක් ද, තමන්ට අදාළ ගැහැනු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ අදාළ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ.)

## 7.0 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ට ලබා දී ඇති විශේෂ අනුග්‍රහය

7.1 ක්‍රියාන්විත රාජකාරියේ යෙදුණු ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ නිලධාරීන් තම දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හෝ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් හෝ අදාළ බලධාරීන් වෙත එවනු ලබන අයදුම්පත් අතරින් සුදුසු ළමයින් තෝරා ගැනීම සඳහා නිර්ණායක හා ලකුණු ක්‍රමයක් අදාළ අමාත්‍යාංශයන් හි ලේකම්වරු හා බලධාරීන් විසින් සකස් කර ඒ අනුව ළමයින් තෝරා ගනු ඇත.

7.2 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් එක් පාසලක එක් සමාන්තර පන්තියක් සඳහා ළමයින් 05 දෙනෙක් බැගින් තෝරා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීමෙන් අනතුරුව පාසල්වලට එම ළමයින් යොමු කරනු ඇත.

7.3 රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ බලධාරීන් විසින් ලකුණු ක්‍රමයක් මත මෙම ළමයින් තෝරා පාසල් ලබා දීමේ කටයුතු සිදු කරන බැවින්, ඒ සම්බන්ධව පැන නගින ගැටලු නිරාකරණය කර ගත යුත්තේ එම අමාත්‍යාංශවල අදාළ බලධාරීන් මඟින් පමණක් ම බව අවධාරණය කර ගත යුතු ය.

## 8.0 ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

8.1 ළමයින් තෝරා ගැනීම සඳහා මව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් විසින් ළමයාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත ද ඉල්ලුම්පතට අමුණන ලද ලිපි ලේඛනවල මුල් පිටපත් ද, ලබා දී ඇති ලකුණු ක්‍රමයට අනුකූල ව ලකුණු ලබා ගැනීම සනාථ කිරීම සඳහා අදාළ වන සියලු ලිපි ලේඛනවල මුල් පිටපත් ද ඉදිරිපත් කළ යුතු ය. මීට අමතරව එම ලේඛනවල ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

8.2 තමා විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල නිරවද්‍යතාව, දිවුරුම් පෙත්සමක් මඟින් සහතික කළ යුතු ය.

8.3 ග්‍රාම නිලධාරී කාර්යාලය මඟින් සටහන් කර ලබා දුන් ඡන්ද හිමි නාම ලේඛනවල ලියාපදිංචි විස්තර මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති ඡන්ද හිමි නාම ලේඛන මඟින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ම සනාථ කර ගනු ඇත. ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය පිළිබඳ යම් ගැටලුවක් මතුවන අවස්ථාවන්හි දී මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් ම එය සනාථ කිරීම කර ගනු ඇත.

8.4 ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් කූට ලේඛනයක් යැයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැඟී යන්නේ නම්, එය නිකුත් කර ඇති ආයතනයෙන් හෝ බලධාරියාගෙන් විමසීමක් කොට එහි සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිට සම්පූර්ණ බලය ඇත. එවැනි අවස්ථා ඇති වූ කල්හි ඒ පිළිබඳව අදාළ බලධාරියාට සුදුසු පරිදි කටයුතු කිරීමට දන්වා සිටිය හැකි ය. ඒ අනුව ඉදිරිපත් කර ඇති ලේඛනයක් හෝ ලේඛන, කූට ලේඛනයක් හෝ ලේඛන යැයි සනාථ වන්නේ නම් එවැනි ලේඛනයක්/ ලේඛන ඉදිරිපත් කිරීමට විරුද්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

8.5 මෙම සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලේඛන හා අනෙකුත් තොරතුරු අනුව ඔබ අභිමුඛයේ දී ලකුණු ලබා දීමේ පත්‍රිකාවේ ලකුණු ඇතුළත් කරනු ලැබේ. එහෙත් වැරදි තොරතුරු/ කූට ලේඛන ලබා දී ඇති බව තහවුරු වුවහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට/ ලකුණු සංශෝධනය කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සම්පූර්ණ බලය ඇත.

## 9.0 තාවකාලික ලැයිස්තුව

9.1 ලකුණු ප්‍රමුඛතා මත එක් එක් ගණ සඳහා වෙන වෙන ම තෝරා ගැනීම සිදු කරන අතර, තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය සකස් කරනු ලැබේ.

9.2 තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛන ප්‍රසිද්ධ කිරීමට පෙර පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ තේරී ඇති ළමයින්ගේ පදිංචිය ස්ථානීය පරීක්ෂණය මඟින් තහවුරු කර ගනු ලැබේ. ස්ථානීය පරීක්ෂණයේ දී පදිංචිය තහවුරු නොවේ නම් ලේඛනයෙන් නම ඉවත් කරනු ලබයි. අවශ්‍ය වන්නේ නම් අනෙකුත් ගණයන් ද ස්ථානීය පරීක්ෂණයට ලක් කළ හැකි ය.

9.3 ගණ කිහිපයකට ඉල්ලුම් කළ ළමයකු යම් හෙයකින් ගණ කිහිපයකට තේරී ඇති අවස්ථාවක දී එම ළමයාගේ නම ඒ අතරින් වැඩි ම ප්‍රතිශතයක් ඇති ගණය යටතේ පමණක් ඉතිරි කර අනෙකුත් ගණවල ලැයිස්තුවලින් ඉවත් කරනු ලැබේ.

9.4 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් තෝරා ගැනීමට නියමිත ළමයින්ගේ තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ අත්සනින් යුතුව පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම විදුහල්පති විසින් සිදු කරනු ලබන අතර, එක් එක් අයදුම්කරුවන්ට පුද්ගලිකව දැනුම් දෙනු නොලබයි. එබැවින් මේ පිළිබඳව දෙමව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් විමසිලිමත්ව සිටීම අත්‍යවශ්‍ය වනු ඇත.

## 10.0 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම.

10.1 ප්‍රදර්ශනය කරන ලද තාවකාලික ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර සති 02ක් ඉකුත්වීමට පෙර ලේඛනවල යම් ස්ථානයක හිමිකම්

නොලැබිය යුතු ළමයෙකුගේ නම අඩංගු වී ඇත්නම් ඒ පිළිබඳ විරෝධතාව හා/හෝ සුදුසුකම් තිබියදීත් තම දරුවාගේ නම නුසුදුසු තැනක ස්ථානගතව ඇත්නම් ඒ පිළිබඳව අභියාචනයක් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ආකෘතියට අනුව, ලියාපදිංචි තැපෑලෙන් විදුහල්පති වෙත වහා ම ඉදිරිපත් කළ යුතු ය. ඒ සමඟ තම නම සහ ලිපිනය සඳහන් ලියාපදිංචි තැපෑල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද එවිය යුතු ය. මෙම සති 02 ක කාල සීමාවෙන් පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් හෝ විරෝධතාවක් සලකා බලනු නොලැබේ.

10.2 විරෝධතා ඉදිරිපත් කිරීමේ දී සම්පූර්ණ ලැයිස්තුවට ම ඉදිරිපත් නොකොට නම් වශයෙන් සඳහන් කර ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී විරෝධයට ලක්වන ළමයා/ ළමයින්ගේ නම්, කැඳවීම් අංකය හා තම විරෝධය කෙටියෙන් ලියා දැක්වීම අවශ්‍ය වේ.

10.3 අභියාචනා හා විරෝධතා විමර්ශනය කිරීම සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ඇත. මෙම මණ්ඩලය මඟින් විරෝධතා ඉදිරිපත් කළ අය, විරෝධතාවයට ලක් වූ අය හා අභියාචනා ඉදිරිපත් කළ අය වෙන් වෙන්ව ප්‍රථම පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපි ලේඛන මඟින් නැවත විමර්ශනයට ලක් කරනු ඇත.

10.4 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කර සනාථ කිරීමෙන් පසුව සුදුසුකම් අනුව (ලකුණු ප්‍රමුඛතා මත) අභියාචනාකරුවන් හා විරෝධතාවයට ලක් වූ/ දැක් වූ අයදුම්කරුවන් තාවකාලික ලැයිස්තුවේ නිසි තැනට ඇතුළත් කොට සංශෝධිත තාවකාලික ලැයිස්තුව සකස් කරනු ඇත.

10.5 එක් එක් ගණය අනුව සංශෝධනය කරන ලද තාවකාලික ලැයිස්තුවෙන් පාසලට ඇතුළත් කර ගත හැකි සංඛ්‍යාව අනුව ඉහළ ම සිටින අය තෝරා ගෙන අවසන් ලේඛනය සකස් කරනු ලැබේ.

10.6 අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන් පසුව ළමයින් තෝරා ගැනීමේ අවසාන ලැයිස්තුව හා පොරොත්තු ලේඛනය අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සාමාජිකයන්ගේ අත්සන් සහිතව පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ඇත.

**10.7 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කරන ලද යම් අයදුම්කරුවෙකු පිළිබඳ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වේ.**

10.8 දෙමව්පියන්/ නිත්‍යානුකූල භාරකරු විසින් ඉල්ලුම් කරන ලද පාසල් කිහිපයකට තම ළමයා තේරුණු අවස්ථාවේ දී දෙමව්පියන්/ නිත්‍යානුකූල භාරකරු විසින් තම අයදුම්පත්‍රයෙහි පාසල් ඉල්ලුම් කරන ලද ප්‍රමුඛතා අනුපිළිවෙල සළකා බලා ප්‍රමුඛතාව වැඩි පාසලේ ලැයිස්තුවේ ළමයාගේ නම ඉතිරි කර අනෙකුත් තේරුණු පාසල් ලැයිස්තුවලින් ළමයාගේ නම ඉවත් කරනු ලැබේ.

10.9 ඉන් පසුව තේරුණු හා නොතේරුණු අයදුම්කරුවන්ට ඒ පිළිබඳව සඳහන් කර ලිපියක් මඟින් විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව දැනුම් දෙනු ලැබේ.

10.10 පළමුවන ශ්‍රේණිය සඳහා සිසුන් තෝරා ගැනීම කාල රාමුවකට අනුව සිදු කරනු ලබයි. තෝරා ගත් ළමයින් 2017 ජනවාරි මාසයේ පළමුවන සතියේ දී පාසල්වලට ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත.

## 11.0 තෝරා නොගත් ළමයින්ට පාසල් ලබා දීම.

කිසිම පාසලකට තෝරා නොගත් ළමයකුගේ මව/ පියා/ නිත්‍යානුකූල භාරකරු විසින් තම දරුවාට විකල්ප පාසලක් ලබා ගැනීම සඳහා තමන් පදිංචි ප්‍රදේශයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට නව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

ඒ අනුව, සෑම දරුවෙකුට ම පාසල් ලබා දීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් සිදු කරනු ඇත.

## 12.0 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.

සියලු ම රජයේ පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම වෙනුවෙන් පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හා සියලු ළමයින්ගෙන් අයකර ගැනීමට පාසල විසින්

අනුමත කර ගෙන ඇති මුදල හැර සෘජුව ම හෝ වක්‍ර ව වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙන යම් බඩු බාහිරාදියක් හෝ පාසලට/ පාසලට සම්බන්ධ සංවිධානවලට/ තුන්වන පාර්ශ්වයකට ලබාදීම සපුරා තහනම් වේ. ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව ද එසේ ලබා දීමක් සිදු නොකළ යුතු ය. එසේ සිදු කරන්නේ නම් එය නීති විරෝධී කටයුත්තක් වන අතර දඬුවම් ලැබිය හැකි වරදක් බව ද සලකන්න.

**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**2016.05.27...**